**තුර්කි විදේශ කටයුතු අමාත්‍ය ගරු මෙව්ලූට් ෂවශෝලු මැතිතුමන් හා විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමන් අතර පැවති නිල සාකච්ඡා වලින් අනතුරුව ගරු මංගල සමරවීර මැතිතුමන් විසින් මාධ්‍ය වෙත කරන ප්‍රකාශය**

සුභ උදෑසනක් නෝනාවරුනි/මහත්වරුනි,

තුර්කි විදේශ කටයුතු අමාත්‍ය ගරු මෙව්ලූට් ෂවශෝලු මහතා ශ්‍රී ලංකාව වෙත පිළිගැනීමට ලැබීම මහත් ගෞරවයක් මෙන්ම භාග්‍යක් ලෙස සළකමි. තුර්කි විදේශ අමාත්‍යවරයෙකු මෙරට පැමිණි ප්‍රථම අවස්ථාව මෙය වන බැවින් මෙම සංචාරය සුවිශේෂී වේ. මෙම සංචාරය තුළින් අපගේ ද්විපාර්ශ්වීය සබඳතාවන්හි නවමු පරිච්ඡේදයකට ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමට හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

ඉතාමත් ඵලදායි සාකච්ඡාවක් පැවැත්වීමෙන් අනතුරුව රජ්‍ය තාන්ත්‍රිය සබදතා, තොරතුරු හා ලේඛණ හුවමාරු කර ගැනීම සඳහා සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට තුර්කි හා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශ විසින් අත්සන් තබන්නට යෙදුනි.

දෙරටේ විදේශ කාර්යාල අතර ගොඩනැගෙන ශක්තිමත් අන්තර් සබදතා තුළින් සෑම අංශයකම ද්විපාර්ශවීය සහයෝගීතාව තව තවත් තහවුරු කර ගැනීමට මග පෑදෙනු නොඅනුමානය.

ෂවශෝලු අමාත්‍යතුමනි, ඔබතුමාගේ සංචාරය සිදුවන මේ යුගය ඉතා වැදගත් වේ. වර්තමාන ආණ්ඩුව විසින් විවෘත පිළිවෙතක් අනුගමනය කරමින් ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර ප්‍රජාව අතර පවතින සබදතා නැවත සමබර කිරීමේ ක්‍රියාවලියක නිරත වන අතර ප්‍රජාතන්ත්‍රවාදය, සංහිදියාව සහ සංවර්ධනය මත පදනම් වූ නව යුගයකට එළඹෙමින් සිටී.

ශ්‍රී ලංකාව සමග පවත්නා වෙළඳ, වාණිජ සහ ආයෝජන සබදතා සහ සහයෝගීතාව අලුත් කර ගැනීමට තුර්කිය විසින් මෑතකදී පියවර ගන්නා ලදී. දෙරට අතර දිගු කාලයක පටන් පැවත එන හවුල්කාරීත්වය තව තවත් තර කර ගැනීමට අපගේ රජය කැප වන බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

අපගේ රජයේ මූලික අභිමථාර්ථය වන යහපාලනය ස්ථාපිත කිරීමේ පියවරක් ලෙස මානව හිමිකම් සුරක්ෂිත කිරීම, සංහිදියාව සහ වගවීම ශක්තිමත් කිරීමට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමන්ගේ රජය විසින් ගෙන ඇති පියවර පිළිබඳ තුර්කි පාර්ශවය දැනුවත් කරන ලදී.

සංවර්ධන සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡාද පැවැත්විණි. තුර්කි ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය සමග සාමුහිකව ක්‍රියාත්මක කරන ප්‍රමුඛ ව්‍යාපෘතින් සදහා තුර්කිය විසින් සපයන ත්‍යාගශීලි දායකත්වය අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. තුර්කි ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ සභාපතිතුමන්ද විදේශ කටයුතු අමාත්‍යතුමන් සමග මෙම සංචාරයට එක්ව සිටියි.

තුර්කියේ වාසස්ථාන හා සම්පත් සංවර්ධනය සදහා සංවිධානය ( OHRD ), මන්නාරමේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබෙන අතර ඒ යටතේ ඇ.ඩො.300,000ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ නිවාස 100 ක් ඉදි කර තිබේ.

ශ්‍රී ලංකාවේ සංවර්ධන සැළැස්මට අනුකූලව තුර්කි ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතන ප්‍රදානය කරන ආධාර යටතේ රජයට ප්‍රමුඛත්වය ලබාදී ඇති ව්‍යාපෘති සදහා සහ ශක්‍යතා සංවර්ධනය සදහා අරමුදල් සැපයීමට කැමැත්ත පල කර තිබේ.

සමීප ආර්ථික සහයෝගීතාවයක් ඇති කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා පිළිබඳවද අපි සාකච්ඡා කළෙමු. ඉදිරි වර්ෂ වලදී අපගේ වෙළඳ පිරිවැටුම වර්ධනය කර ගැනීමට අපි උනන්දු වන්නෙමු. ශ්‍රී ලංකාවේ පවත්නා ආර්ථික ඉඩ ප්‍රස්ථා වලින් ප්‍රයෝජන ගැනීම සඳහා තුර්කි ආයෝජකයින් වඩ වඩාත් උනන්දු කර වීමද අවශ්‍යය. ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමට අත්සන් තැබීම මගින් දෙරට අතර ආර්ථික හා තාක්ෂණික

සහයෝගීතාවය ශක්තිමත්වී ඇති අතර එම ගිවිසුම 2007 දී (2007 නොවැම්බර් 27) බලාත්මක වනු ඇත. ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ ශ්‍රී ලංකා - තුර්කි ඒකාබද්ධ කමිටුවේ දෙවන රැස්වීමද අපි ඉක්මනින්ම පවත්වන්නෙමු.

මූල්‍ය සහයෝගීතාවය හරහා අප සබඳතා තව දුරටත් වැඩි දියුණු කරගැනීමේ අරමුණින් නුදුරේදීම ශ්‍රී ලංකාව හා තුර්කිය අතර අවබෝධතා ගිවිසුමකටද අත්සන් තැබෙනු ඇත. මෙම අවබෝධතා ගිවිසුම යටතේ තුර්කි එක්සිම් බැංකුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 350 ක ණය මුදලක් අනුමත කරනු ඇත.

නිරන්තරයෙන් සිදුවන ඉහළ මට්ටමේ අන්‍යෝන්‍ය කටයුතු හේතු කොට ගෙන තුර්කිය හා ශ්‍රී ලංකාව අතර ඇති සබඳතා ශක්තිමත් කිරීමට මග සැළසෙනු ඇතැයි මම විශ්වාස කරමි. එමගින් අප දෙරටටත් දෙරට ජනතාවටත් මහත් ප්‍රයෝජන සැළසෙනු ඇත.

අද උදෑසන මෙව්ලූට් ෂවශෝලු  අමාත්‍යවරයා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බැහැදුටු අතර මෙම සාකච්ඡා වලින් අනතුරුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා වෙනත් අමාත්‍යවරුන් සමග සාකච්ඡා පැවැත්වීමටද නියමිතය. අපගේ ප්‍රමුඛතාවයන් හඳුනාගෙන අප දෙරට අතර පවත්නා සමීප හා මිත්‍රශීලි සබඳතා ඉහළ මට්ටමකට ගෙන යෑමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීමට එම සාකච්ඡා මගින් මග පෑදෙනු ඇතැයි මා විශ්වාස කරමි.

මෙව්ලූට් ෂවශෝලු අමාත්‍යවරයා හා ඔහුගේ නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ ගත කරන කාලය ඉතා ප්‍රීතිමත් එකක් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

ස්තූතියි!

බටහිර අංශය
විදේශ කටයුතු අමාත්‍යාංශය
2016 ජූනි 15